**140 - ප්‍රජා සවිබලගැන්වීම් හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

---

**1.1 තත්ත්වාගණනය කළ මතය**

---

ප්‍රජා සවිබලගැන්වීම් හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ප්‍රජා සවිබලගැන්වීම් හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 29 වන දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ඔක්තෝබර් 09 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙළ කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ප්‍රජා සවිබලගැන්වීම් හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවර්ණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමසඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්,වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිත කරන ලද ගිණුම්කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බවසහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයතුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳවප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) මෙම වාර්තාවේ 1.6.4 ඡේදයේ (අ (ආ) ඇ) , 1.6.5 ඡේදයේ (අ), 1.6.7ඡේදයේ (අ) -(iii) (iv), 3.12 ඡේදයේ (ඌ) (ඔ) (ඕ) සහ 5 (අ) ඡේදයේ ඇතුළත් නිරීක්ෂණ සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවේ පෙන්වා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| භාණ්ඩාගාර මුද්‍රිත සටහන්වලට අනුව තැන්පතු ලැබීම් රු.87,180ක් අඩුවෙන්ද තැන්පතු ගෙවීම් රු.34,125ක් අඩුවෙන්ද ගිණුමේ දක්වා තිබීම නිසා භාණ්ඩාගාරයට පියවිය යුතු අග්‍රිමබැර ශේෂයරු. 53,055කින් වැඩියෙන් ගිණුමේ දක්වා තිබුණි. | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.1 ඡේදයට අනුව භාණ්ඩාගාර මූල්‍ය ප්‍රකාශයේ අදාල අමාත්‍යාංශයට පවතින ශේෂ අනුව අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුවීම. | රු.34,125 හා රු.53,055ක ආදායම් ගිණුම්කරණ වැරදි නිවැරදි කරමින් මහා භාණ්ඩාගාරය වෙත යැවූ අංක 19/12/01 දරණ මාරු පත්‍රය සඳහා මහා භාණ්ඩාගාරයෙන් 13/88 ගිණුමේ ලැබීම් වලින් ඉවත් කර එම ගිණුමේම ගෙවීම් වලට සටහන් කිරීමත් රු. 53,055.62ක වටිනාකම නිවැරදි නොකිරීමත් හේතුවෙන් මෙම වෙනස දැක්වේ.ඒ අනුව අමාත්‍යාංශ ගිණුම් වල දක්වා ඇති පරිදි නිවැරදි බව ප්‍රකාශ කරමි.. |

### 1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට රු.5,455,801ක් අඩුවෙන් දැක්වූ දේපළ, පිරියත හා උපකරණ ශේෂය නිවැරදි නොකිරීම නිසා 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපළ, පිරියත හා උපකරණ ශේෂය ද එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | අමාත්‍යාංශය පවත්වාගෙන යනු ලබන ලේඛන නිවැරදිව පවත්වා ගෙන යෑමට කටයුතු කල යුතු වීම. | පිළිගනිමි, මේ වනවිට මෙම වටිනාකම මහා භාණ්ඩාගාරයට දැනුම් දී ඇති අතර ඒ අනුව නිවැරදිව සටහන් කර ඇත. |

## 1.6.3 ගිණුම්කරණඅඩුපාඩු

---------------------

**(අ) ආදායම් නොවන ලැබීම්**

-------------------------

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ආදායම් නොවන ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | **ණය නැවත අයකර ගැනීම**<br>මාසික ගිණුම් සාරාංශයෙහි වෙනත් ලැබීම් යටතේ නිවාස ණය නැවත අයකර ගැනීම් ලෙස රු.33,952,233ක් රජයේ ආදායමට බැර කර තිබුණද 2020 මැයි 28 දිනැති සංවර්ධන අංශයේ අතිරේක ලේකම්ගේ ලිපියට අනුව 2019 වර්ෂයේ මුළු ණය නැවත අය කිරීම රු.14,284,419ක් බව දක්වා තිබුණි. ඒ අනුව 2019 වර්ෂයේ ණය නැවත අය කිරීම හා රජයේ ආදායමට බැර කල ශේෂය අතර රු.19,695,783ක වෙනසක් නිරීක්ෂණය විය. | ආදායම් නොවන ලැබීම් ගිණුම් ගත කිරීමේදී පවත්වා ගත යුතු පොත්පත් නිසිපරිදි නඩත්තු කර සංවර්ධන අංශයේ පොත් අනුව හා ගිණුම් අංශයේ පොත් අනුව තොරතුරු හා ගිණුම් සැසදීම් කර ගිණුම් නිවැරදිව පිළියෙල කිරීමට හා ආදායම නිවැරදිව රජයේ ආදායමට බැරකිරීමට කටයුතු කල යුතු වීම. | සංවර්ධන අංශයට අනුව 2019 වර්ෂයේ මුළු ණය නැවත අය කර ගැනීම් රු.14,284,419 පහත පරිදි සකස් වී ඇත.<br>• කළමනාකරණ ගාස්තු වලින් අය කර ගන්නා ලද නිවාස ණය වාරික.<br>•වතු කළමනාකරුවන් හරහා අය කර ගනු ලබන නිවාස ණය වාරික.<br>වෙනත් ලැබීම් ආදායම් සංකේතය යටතට සංවර්ධන අංශය මගින් අය කරනු ලබන මුදල් පමණක් ම ඇතුළත් නොකරන බව දන්වමි. |
| (ii) | 2018 දෙසැම්බර් 31 දිනට රජයේ ආදායමට ගිණුම්ගත නොවූ 2018 වර්ෂයේ ණය එකතු කිරීම් රජයේ ආදායමට අඩුවෙන් බැර කිරීම රු.1,092,776ක් හා 2017 වර්ෂයේ ණය එකතු කිරීම් රජයේ ආදායමට අඩුවෙන් බැර කිරීම රු. 12,531,657ක් වන ලෙස 2018 දෙසැම්බර් 31 දිනට රජයේ ආදායමට අඩුවෙන් බැර කිරීම රු.13,624,433ක් විය. මෙය 2019 දෙසැම්බර් 31 දින දක්වා නිවැරදි කර නොතිබුණි. | - එම - | පිළිතුරු ලබාදී නොමැත. |

## (ආ) අත්තිකාරම් ගිණුම් ශේෂ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2019 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශ පොත් අනුව අත්තිකාරම් ගිණුමේ අංක 12 බැර ශේෂය හා භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව බැර ශේෂයෙහි රු. 699,805ක වෙනසක් විය. . | 2019 දෙසැම්බර් 03 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 271/2019 විධිවිධාන අනුව ගිණුම් තබා නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කල යුතු වීම. | පිළිගනිමි. |
| (ii) | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ වර්ෂයේ ලැබීම් වලට අදාලව අමාත්‍යාංශ පොත් අනුව හා ශේෂ පිරික්ෂුම අනුව ශේෂයන් අතර රු.704,997 ක වෙනසක් නිරීක්ෂණය විය. අත්තිකාරම් පාලන ගිණුම නිවැරදිව සකස් කර නොතිබීම හේතුවෙන් එම වෙනස හදුනාගෙන නොතිබුණි. එම නිසා 2019 දෙසැම්බර් 31 දිනට ගිණුම ඉදිරිපත් කිරීමේදී මුදල් රෙගුලාසි 427(4) අනුව වෙනස්කම් වලට හේතුන් වෙන් වෙන්ව දැක්වීමෙන් තොරව රු.400 ක ශුද්ධ වෙනස පමණක් ගිණුමේ 2.1 ආකෘතියේ දක්වා තිබුණි. | 2019 දෙසැම්බර් 03 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 271/2019 විධිවිධාන අනුව ගිණුම් තබා නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කල යුතු වීම. | ගිණුමේ 2:1 ආකෘතියේ දක්වා ඇති රු: 400ක ශුද්ධ වෙනස 2017 වර්ෂයේ විශේෂ අත්තිකාරම් වැඩිපුර අයකර ගැනීමත් වන අතර එම වෙනස 2020 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | 2018 මැයි හා ජූනි යන මාස වල අමාත්‍යාංශයෙන් ස්ථානමාරු වී ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතුරු.338,754 ක ණය ශේෂ 2020 මැයි 13 දින දක්වාම අයවී නොතිබුණි. | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 වගන්තියේ උපදෙස්වලට අනුවහා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 118 හා 2004 ඔක්තෝබර් 11 දිනැති චක්‍රලේඛයේ 1.1.6 හා 1.1.7 ඡේද ප්‍රකාරව ණය අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | අදාළ නිළධාරියාගේ වැටුප් විස්තර ස්ථාන මාරු වී ගිය අමාත්‍යාංශය වෙත හා පළාත් අධ්‍යාපන කාර්යාලයක් වෙත යවා ඇති නමුත් මේ දක්වා අදාළ මුදල පියවීමට කටයුතු කර නැත.<br>නැවත විමසීම් කර අය කර ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| **(iv)** | 2017 ජුලි 22 දින මිය ගිය නිලධාරියෙකු ගෙන් අයවිය යුතු රු.136,550ක හිඟ ණය ශේෂ අයකරගෙන නොතිබුණි. | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.4, 4.5 හා 4.6 වගන්තියේ උපදෙස් වලට අනුව ණය අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | අදාළ හිඟ ණය මුදල මිය ගිය නිළධාරියාගේ මරණ පාරිතෝෂිතයෙන් අයකර ගැනීම සඳහා අයදුම්පතක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු ඇතත් මේ දක්වා එම මුදල පියවා නැත. |
| **(v)** | 2018 ජුනි 15 දින විශ්‍රාම ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.134,000ක හිඟ ණය ශේෂ 2020 මැයි 26 දින දක්වාම අයකර ගෙන නොතිබුණි. | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.3 හා 4.2.4 හා 4.2.5 සහ 2017 දෙසැම්බර් 29 දිනැති අංක 262/2017 දරන රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය ද අනුව කටයුතු කළ යුතු වීම. | මෙම විශ්‍රාමික නිළධාරියා අදාළ හිඟ ණය මුදල අමාත්‍යාංශ බැංකු ගිණුමේ තැන්පත් කර ඇති අතර වැරදීමකින් එම මුදල රජයේ ආදායමක් ලෙස සලකා ගිණුම් ගත කර ඇති අතර මෙම වර්ෂයේ දී එම වරද නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (vi) | සේවය හැර ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.326,582ක ණය ශේෂය තුල වසර 5ක් ඉක්මවූ රු. 107,896ක් හා වසර 6ක් ඉක්මවූ රු. 2,250ක ණය ශේෂය විගණන දින වන 2020 මැයි 26 දින දක්වාම අයවී නොතිබුණි. | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 වගන්තියේ උපදෙස්වලට අනුව ණය අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | සේවය අතහැර ගිය නිළධාරීන් දෙදෙනාගෙ ආපදා ණය ගොනු හා පෞද්ගලික ගොනු මෙම අමාත්‍යාංශයේ නොමැත. පශු සම්පත් අමාත්‍යාංශයෙන් විමසීමට කටයුතු කරමි.<br>රු.216,436ක් අය විය යුතුව ඇති නිළධාරියා වෙත අවසන් දැනුම් දීම ලෙස 2019.10.29 දින ලිපියක් යවා ඇත. |

## 1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **ඇප ලේඛනය** | | |
| | මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | ඇප ලේඛණයන් පවත්වා ගැනීමට කටයුතු සටහන් කර ගතිමි. |
| (ආ) | **බැරකම් පිළිබඳ ලේඛනය** | | |
| | මුදල් රෙගුලාසි 214 හා 447 (4) හා (5) ප්‍රකාරව බැරකම් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන නොතිබුණි | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් ලේඛනයක සටහන් කළ යුතු වීම. | සියලුම බැරකම් සිගාස් පරිගණක වැඩසටහන වෙත නිවැරදිව ඇතුළත් කරනු ලබන අතර ඊට අදාළ ගොනුව මෙම මාසය තුළදි ස්ථාපිත කරමි. |
| (ඇ) | **ණය අයකරගැනීම අරමුදල සඳහා පොත්පත් පවත්වා ගැනීම** | | |
| | මුදල් රෙගුලාසි 501 (ඇ) හා 502 (ආ) අනුව චක්‍රිය අරමුදල යටතේ හා ණය පදනමින් නිවාස ලබාදීමේ දී දෙන ණය මුදල්, හිමිකම්පෑම් වෙනුවෙන් කෙරෙන කොටස් ගෙවීම් ගිණුම්ගත කිරීම හා නියම කරන ලද කොන්දේසි ප්‍රකාරව සම්පූර්ණ මුදලම ආපසු අයකර ගැනීම සහතිකවීම සඳහා පොත්පත් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව පොත් පත් පවත්වා ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ණය අයවීම් පිළිබඳ තොරතුරු අමාත්‍යාංශයේ නොමැති බවත්, ක්ෂේත්‍ර නිලධාරීන්ගෙන් ලබා ගන්නා තොරතුරු අනුව වැඩසටහන ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව දක්වා ඇත. |
| (ඈ) | මුදල් අමාත්‍යාංශය විසින් 2017 පෙබරවාරි නිකුත් කර ඇති ව්‍යාපෘති හා කොන්ත්‍රාත් කළමණාකරණය සඳහා මගපෙන්වීමෙහි මුදල් සපයන නියෝජිත ආයතනය මගින් පවත්වාගෙන යායුතු ලේඛන හා ආකෘති සම්බන්ධව කාණ්ඩ අංක 2හි සඳහන් පරිදි ලේඛණ හා වාර්තා අමාත්‍යාංශය පවත්වාගෙන ගොස් නොතිබූණි. | කොන්ත්‍රාත්තු යටතේ සිදු කල ගෙවීම්, ගෙවිය යුතු ශේෂ හා අයකිරීම් හඳුනාගත හැකි ලෙස ලේඛන නඩත්තු කල යුතු වීම. | 2020 වර්ෂයේ දී සිට ඉහත ආකෘති පවත්වා ගැනීමට කටයුතු කරමි. |

**1.6.5 විගණන සාක්ෂි නොවීම**

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| | නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ගොඩනැගිලි කුලී, සේවා සැපයීම් හා ඉදිකිරීම් ව්‍යාපෘතිවල බැඳීම් පරීක්‍ෂා කිරීම සඳහා එකඟ වී ඇති ගිවිසුම් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | මුදල් රෙගුලාසි 702(3) අනුව කොන්ත්‍රත් සඳහා ගිවිසුම්වලට එළඹිය යුතු වීම. | අදාළ ගිවිසුම් අමාත්‍යාංශයේ පාලන අංශය සතුව ඇත. අවශ්‍ය විටෙක ලබා දීමට හැකිය. |
| (ආ) | වැවිලි මානව සංවර්ධන භාරය විසින් නිවාසලාභීන්ට දෙන ණය මුදල්, වෙනුවෙන් ඔවුන් විසින් කෙරෙන කොටස් ගෙවීම් හා පොලිය අමාත්‍යාංශයට නැවත ගෙවිය යුතු අතර අමාත්‍යාංශයට නොගෙවා ඇති මුදලත්, ඒ වෙනුවෙන් හිලවු කරගත් කළමනාකරණ ගාස්තු ප්‍රමාණය පිළිබඳවත් විස්තරාත්මක වාර්තාවක් හා එම මුදල් ආපසු අයකර ගැනීමට අදාල සියලුම ගණුදෙනු සටහන් කර තබාගත් පොත්පත් හා ලේඛණ අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් නොවීය. | එක් එක් නිවාස ව්‍යාපෘතිය යටතේ හා ඒක් ඒක් කොන්ත්‍රාත්තු යටතේ සිදු කල ගෙවීම් හා අයකිරීම් හඳුනගත හැකි ලෙස ලේඛන නඩත්තු කල යුතු වීම. | නිවාස ණය නැවත අය කර ගැනීම පිළිබඳව විස්තර සංවර්ධන අංශය සතුව ඇති අතර අදාළ විස්තර ලබා දීමට කටයුතු කරමි. 2019 වර්ෂය තුළදී වැවිලි මානව සංවර්ධන භාරයට අය විය යුතු කළමණාකරණ ගාස්තුවෙන් රුපියල් මිලියන 03ක් අමාත්‍යාංශය වෙත නොගෙවූ ණය වාරික වෙනුවෙන් අඩු කරගෙන ඇත. |
| (ඇ) | ප්‍රාග්ධන වැය විෂයයන් 3ක් යටතේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සඳහා 2019 වර්ෂය තුල රු. 2,800,000,000ක ප්‍රතිපාදනමත ඇති කරගත් බැදීම් සම්බන්ධයෙන් ගිවිසුම් හා කෙරිගෙනයන වැඩ සම්බන්ධව හා ගෙවිය යුතු මුදල් සම්බන්ධ විස්තරාත්මක උපලේඛණයක් හෝ විගණනයට ඉදිරිපත් නොවීය. | එක් එක් නිවාස ව්‍යාපෘතිය යටතේ හා එක් එක් කොන්ත්‍රාත්තු යටතේ සිදු කල ගෙවීම් හා අයකිරීම් හඳුනගත හැකි ලෙස ලේඛන නඩත්තු කල යුතු වීම. | අදාළ විස්තර ඇතුළත් CR ලේඛණයක් දැනට පවත්වාගෙන යන අතර එහි පවතින අඩුපාඩු නිවැරදි කර ඉදිරියේදී කොන්ත්‍රාත් ලේඛණයක් පවත්වා ගැනීමට කටයුතු කරමි.<br>මූල්‍ය හා භෞතික ප්‍රගති වාර්තාව සම්පූර්ණ කර ඉදිරිපත් කිරීමට ඉදිරියේදී කටයුතු කරමි. |

**1.6.6 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීවිසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලබාදී නොමැත. |

**1.6.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 214 | බලය දෙන නිලධාරීන් මෙන්ම සහතික කරන නිලධාරීන් විසින් බැරකම් පිළිබඳ ලේඛන නිතිපතා පරීක්ෂා කල යුතු වුවද එලෙස පරීක්ෂා කර නොමැති බව විගණනයට නිරීක්ෂණය විය. | අදාල මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කල යුතු වීම. | ඉදිරියේදී ලබා දී ඇති උපදෙස් පරිදි බැරකම් ලේඛණයක් පවත්වා ගැනීමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි අංක 388 | කොන්ත්‍රාත්කරුවන්ට ලබාදිම සඳහා ගිණුම් අංශය මගින් වැවිලි සංවර්ධනය භාරය නමින් ලියනු ලබන චෙක්පත් ඔවුන් වෙත ලබාදීම වෙනුවට සංවර්ධන අංශයේ නිලධාරීන් වෙත ලබා දී පසුව ඔවුන් විසින් වැවිලි සංවර්ධනය භාරය වෙත භාර දෙනු ලැබූවද එසේ චෙක්පත් භාරදීමේදී රෙගුලාසි ප්‍රකාරව ලේඛනයක් පවත්වා නොතිබුණි. | අදාල මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කල යුතු වීම. | පිළිතුරු ලබාදී නොමැත. |
| (iii) | මුදල් රෙගුලාසි 570 සහ මු.රෙ.571(1) | ඉකුත් වූ සියළුම තැන්පතු පිළිබඳව සෑම අර්ධ වර්ෂයක් අවසානයේදී ලැයිස්තුවක් පිළියෙල කල යුතු වුවත් එසේ පිළියෙළ කර නොතිබුණි. | අදාල මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කල යුතු වීම | මෙම තොරතුරු අමාත්‍යාංශයේ සංවර්ධන අංශය හරහා වාර්තාගත වේ. |
| (iv) | මුදල් රෙගුලාසි 571 (3) | පොදු තැන්පතු ගිණුම් දෙකක වර්ෂ 2ක් ඉකුත් වූ තැන්පතු අවස්ථා 116ක එකතු වටිනාකම රු.56,355,960ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අදාල මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කල යුතු වීම | ඉතිරි මුදල් සම්බන්ධව ඉදිරියේ දී මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කරමි. ගිණුමේ පවතින වර්ෂ දෙක ඉකුත් වූ මුදල් ව්‍යාපෘති අවසන් කර මාස 06කින් පසු ඉල්ලීම් මත මුදල් නිදහස් කිරීමට කටයුතු කරමි. |
| (v) | මුදල් රෙගුලාසි අංක 702 (3) | අමාත්‍යාංශය විසින් අත්සන් කරන ලද සියළුම කොන්ත්‍රාත්තු වල පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි. | අදාල මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කල යුතු වීම. | ඉදිරියේදී කටයුතු කිරීමට සංවර්ධන අංශය වෙත උපදෙස් ලබා දුන්නෙමි. |
| (ආ) | භාණ්ඩාගාර ලේකම්ගේ අංක 3/2015 හා 2015 ජුලි 14 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ (ඇ) ඡේදය සහ මුදල් රෙගුලාසි 371(5) | 2019 වර්ෂයේ කරන ලද නියැදි පරීක්ෂාවට අනුව අවස්ථා 44කදී ලබාගත් අත්තිකාරම් දින 12 සිට දින 143ක් දක්වා රු.2,375 සිට රු.91,990 දක්වා එකතුව රු. 1,047,150ක් වියදම් නොකර අත රදවාගෙන සිට මුදලින් පියවා තිබුණි. | අදාල මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කල යුතු වීම | අත්තිකාරම් ලබා ගත් අවශ්‍යතාවයට අදාල වියදම් ඊට පෙර සිට වැයකර තිබීම නිසා ඒවා ප්‍රතිපූරණය කර ගැනීම හා අනෙකුත් රාජකාරි අවලංගු වීම නිසා එම ලබාගත් මුදල් නැවත පියවන ලදී. |

**1.6.8 අවිධිමත් ගනුදෙනු**

**---------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) අධිකාර බලය නොමැති වූ ගනුදෙනු**

**----------------------------------------**

අමාත්‍යාංශය විසින් අධිකාරී බලය නොමැතිව පහත සඳහන් ගනුදෙනු කර තිබුණි.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------- | ------------ | -------------------------- |
| **(i)** | ඇපයෙන් සීමිත සමාගමක් වන වැවිලි මානව සංවර්ධන භාරය වර්ෂ ගණනාවක සිට අමාත්‍යාංශය වෙනුවෙන් ණය එකතු කර ඇති අතර එහි විගණිත මූල්‍ය ප්‍රකාශනයන් අනුව 2018 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයට ගෙවිය යුතුව පැවති ශේෂය රු.මිලියන 31.02ක් විය. වැවිලි මානව සංවර්ධන භාරයට ගෙවිය යුතුව පැවති කළමණාකරණ ගාස්තු වලින් රු.මිලියන 2.97ක් සමාලෝචිත වර්ෂයේදී ලැබීම් ලෙස අයකරගෙන තිබීම නිසා ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී එකතු කල මුදල් හැර 2018 දෙසැම්බර් 31 දිනට පැවති ශේෂයෙන් පමණක් තව දුරටත් වැවිලි මානව සංවර්ධන භාරයෙන් අමාත්‍යාංශයට ලැබිය යුතු හා රජයේ ආදායමට බැර විය යුතු වටිනාකම රු.මිලියන 28.05ක් විය. | රජයේ මුදල් බාහිර පාර්ශවයන් තුල තබා ගැනීමට ඉඩ ලබා නොදී නියමිත දිනට බැර කිරීමට හැකි වන පරිදි අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම යෙදිය යුතු වීම. | පිළිතුරු ලබාදී නොමැත |
| **(ii)** | අත්තිකාරම් ලබාගැනීමට යෝජිත කාර්යය සඳහා ලිඛිත වැඩසටහනක් අනුමත කර ගැනීමෙන් පසුව අත්තිකාරම් මුදල් ලබාදිය යුතු වුවත් අවස්ථා 7කදී පුද්ගලයින් 5ක් විසින් ගත් රු.7,000 ත් රු.75,250 ත් අතර වූ එකතුව රු.184,700ක් වූ සම්පූර්ණ මුදලම (වැය කිරීමෙන් තොරව) දින 11 සිට දින 14 ත් අතර කාල පරාසයක් තුල අත රඳවා ගැනීමෙන් පසුව පියවා තිබුණි. | ලිඛිත වැඩසටහනක් අනුමත කර ගැනීමෙන් පසුව පමණක් අත්තිකාරම් මුදල් ලබාදිය යුතු වීම. | පිළිතුරු ලබාදී නොමැත |

**(ආ) අනුමත නොකළ ගනුදෙනු**

---------------------------------

විධිමත් අනුමැතියකින් තොරව පහත සඳහන් ගනුදෙනුව සිදු කර තිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වැව්ලි මානව සංවර්ධන භාරයට ගාස්තුවක් ගෙවීම යටතේ කළමණාකරණ සහය ලබා ගැනීමට 2006 නොවැම්බර් 30 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබි තිබුණි. නමුත් එම අනුමැතියට හා ප්‍රසම්පාදන ක්‍රියාවලියට පටහැනිව අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන නිවාස යෝජනා ක්‍රමවල කොන්ත්‍රාත් අධීක්‍ෂණයට අමතරව කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම, කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් කිරීම වැව්ලි මානව සංවර්ධන භාරය විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.1(අ) මාර්ගෝපදේශයෙන් බැහැරව ඉටුකර ඇති බව නිරීක්‍ෂණය විය. තවද, ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුවන් නමින් ගෙවිය යුතු චෙක්පත් පළමුව වැව්ලි මානව සංවර්ධන භාරය නමින් නිකුත්කර තිබූ අතර එලෙස ගෙවීම් කිරීමට ලබාගත් අනුමැතිය ද විගණනයට ඉදිරිපත් නොවීය. ඊට අමතරව අමාත්‍යාංශය හා මෙම ආයතනය අතර අදාල කාර්යයන් සඳහා ගිවිසුමක් හෝ නොතිබුණි. | පවතින නීති රීති වලට අනුව හා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් විධිවිධානද සැලැකිල්ලට ගෙන මහජනයාට උපරිම යහපත සැලසෙන පරිදිත් රජයේ මුදල් උපරිම කාර්යක්ෂමව හා විනිවිධභාවයෙන් යුතුව පාවිච්චි කළ යුතු වීම. | පිළිතුරු ලබාදී නොමැත |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 අග්‍රිම කළමනාකරණය**

---------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂයේ ශුද්ධ ප්‍රතිපාදනය රු.4,667,859,000ක් වන අතර අමාත්‍යාංශයේ අග්‍රිම සැලැස්ම අනුව වර්ෂය තුළ ඉල්ලුම් කළ යුතු මුළු අග්‍රිමය රු.3,797,022,000ක් වුවද එම අග්‍රිම සැලැස්ම ද ඉක්මවා එකතුව රු.3,903,315,000ක අග්‍රිම වර්ෂය තුළ ඉල්ලුම කර තිබුණි. නමුත් වර්ෂය තුල අග්‍රිම ලැබීම් රු. 1,479,160,000ක් වූ අතර එය මුළු අග්‍රිමඉල්ලුමෙන් සියයට 32ක් විය. | | මාසිකව ඉල්ලුම් කරන පරිදි අක් මුදල් නොලැබීම නිසා ඉතිරි ප්‍රතිපාදන වියදම් සැලසුම් හා පෙර මාස වලදී අඩුවෙන් ලද අක් මුදල් ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් එක් එක් මාසයේදී ඉල්ලුම් කර ඇති බැවින් සැලසුමට වැඩියෙන් අක් මුදල් ඉල්ලා ඇත. |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්‍ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශ ලේකම් අමතන ලද ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක BD/EE140/1/4 හා 2019 ජුලි 17 දිනැති ලිපිය මගින් වැය විෂය අංක 140-02-04-05-2506 (17) යටතේ වාර්ෂික ප්‍රතිපාදන වලින් රු. මිලියන 15ක් අවුරා තබන ලෙස දැනුම් දී තිබිය දී එයට පටහැනිව රු. මිලියන 4.9ක් පමණක් ද ඉතිරි කර තිබූ බව නිරික්ෂණය විය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | 140-02-04-05-2506(17) වැය විෂය යටතේ ලද නිවාස ප්‍රදානයන්ට අනුරූපව අවශ්‍ය යටිතල පහසුකම් ඉදිකිරීම සඳහා එම ප්‍රතිපාදන වැය කර ඇති අතර ඒ අනුව 5% ප්‍රමාණයක් පමණක් ඉතිරි කිරීමට හැකි වී ඇත. |
| (ආ) | මුලධන වැය විෂයන් 11ක් සඳහා වෙන්කළ රු.2,811,550,000ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.1,179,103,828ක් වැය කර සියයට 25 සිට 99 දක්වා වූ පරාසයක් තුළ රු.1,632,446,173ක ඉතිරියක් නිරික්ෂණය විය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ 04/2019 හා උපදෙස් අනුව ප්‍රසම්පාදන කටයුතු සීමා කිරීමට හා වැළැක්වීමට සිදු වූ බැවින් වසර අග සැලසුම් කර තිබූ ප්‍රසම්පාදනයන් සිදු කිරීමට නොහැකි විය. |
| (ඇ) | 140-2-4-2-2506 හා 140-2-4-3-2506 යන මුලධන වැය විෂයන් 2ක් සඳහා එකතුව රු.200,000,000ක පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන 2019 ජුලි 01 දින සම්මත කර තිබුණි. නමුත් වර්ෂ අවසානයේ එසේ සම්මත කර ගත් පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනයද ඉක්මවා රු. 1,559,991,875ක් ඉතිරිවීම් කර තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | පෙර සඳහන් කළ පරිදි අක් මුදල් නොලැබීම හේතුවෙන් අවසන් කරන ලද වැඩ සඳහා ගෙවීම් සිදු කිරීමට නොහැකිව වැය විෂයන් හි ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |
| (ඈ) | 140-1-2-1-2201 යන මුලධන වැය විෂය සඳහා රු.3,000,000ක් හා රු.1,500,000ක පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන 2019 පෙබරවාරි 14 හා 2019 සැප්තැම්බර් 20 දින සම්මත කර තිබුණි. ඉන් සියයට 33.3ක් පමණක් එනම් රු.1,500,000ක් පමණක් උපයොජනය කර තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | වෙන් කර දුන් ප්‍රතිපාදන වලට අනුරූපව අක් මුදල් නොලැබීම හේතුවෙන් සැලසුම් කළ පරිදි වියදම් කිරීමට නොහැකි වීම නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |

## 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්‍ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනයේ සටහන් අංක (iii) බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ බැදීම්, බැදීම් ශේෂය , බැරකම් හා බැරකම් ශේෂවල අගයන් සනාථ කරගැනීම සඳහා විගණනයට අවශ්‍ය තොරතුරු හා ලේඛන ඉදිරිපත් නොවිය. | මුදල් රෙගුලාසි අනුව බැරකම් ලේඛනයක් පවත්වා ගනිමින් සෙසු අංශ සමග කාලීනව ක්‍රියා කර මුදල් වර්ෂය තුල බැරකම් නිසි පරිදි හඳුනාගත යුතු අතර තොරතුරු විගණනයට ලබාදිය යුතු වීම. | අතපසු වීමකින් සිදු වී ඇත. නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 255/2017 ට අනුව සියලු බැරකම්, බැරකම් ලෙස ලේඛන ගත කළ යුතු වුවත් එසේ ලේඛණ ගත නොකරන ලද, නමුත් 2020 පෙබරවාරි 29 දින වන විට ගෙවීම් කර තිබූ සැපයීම් හා සේවා සම්බන්ධයෙන් නොවන වැය විෂයන් 3 ක් හා සැපයීම් හා සේවා සම්බන්ධයෙන් වන වැය විෂයන් 3ක් යටතේ මුළු බැරකම් වටිනාකම පිළිවෙලින් රු.613,417 ක් හා රු.1,086,080 ක් මූල්‍ය ප්‍රකාශයේ සටහන් අංක (iii) යටතේ සටහන් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 94(1) ට අනුව බැරකම් ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ගැනීමට අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම යෙදිය යුතු වීම. | පිළිගනිමි. සිගාස් වැඩසටහන මඟින් මෙම කාර්ය සිදු කරන අතර සහතික කරන අවස්ථාවේ වවුචරය මත අදාළ බැරකම් අංකය සටහන් කර සහතික කිරීම සිදු කරනු ලැබේ. ඉදිරි වර්ෂ වලදී අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | 2017 අප්‍රේල් 27 දිනැති 255/2017 අංක දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයට අනුව 2018 වර්ෂයේ කාර්යයන් සඳහා 2019 වර්ෂයේදී ගෙවීම් කිරීමට 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයේ බැදීම් ලෙස දක්වා තිබිය යුතු නමුත් 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ අනුව බැරකම් හා බැදීම් කිසිවක් දක්වා නොතිබුණි. නමුත් 2018 වර්ෂයේ කාර්යසාධන වාර්තාව හා 2019 ඔක්තෝබර් 31 දක්වා වූ ප්‍රගති වාර්තාව අනුව 2018 වර්ෂයේ ආරම්භක එම වර්ෂයේ නිම නොකර ඉදිරියට ගෙන එන ලද නිවාස ඒකක 1,566ක් අතරින් නිවාස 1,489ක් සඳහා රු. මිලියන 280.578ක් ඉහත චක්‍රලේඛයට පටහැනිව 2019 වර්ෂයේදී ගෙවා ඇති බව නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි 94(1) ට අනුව බැරකම් ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ගැනීමට අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම යෙදිය යුතු වීම. | 2019 වර්ෂයේදී මෙම අඩුපාඩු අවම කර ගැනීමට කටයුතු කරන අතර ඉදිරියේදී සංවර්ධන අංශය සමඟ සාකච්චා කර නිවැරදි තොරතුරු ලබා ගැනීමට කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වැවිලි කලාප 6ක් යටතේ 2019 වර්ෂය තුලදී ඉදිකිරීමට අනුමත කර ඇති එකතු වටිනාකම රු. මිලියන 551ක් වන නිවාස 551ක් 2019 දෙසැම්බර් 31 දින වන ඉදිකිරීම් ආරම්භ කර හෝ නොතිබුණි. | සැලසුම් කළ පරිදි නිවාස ඉදිකිරීමට කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ආ) | චක්‍රීය අරමුදල මගින් ලබාදුන් ණය ශේෂයන් ගෙන් 2016 අගෝස්තු මාසයේදී ණය ලබාදුන් ප්‍රතිලාභීන් 6 දෙනෙකුගෙන් අයවිය යුතු ණය වාරික 4 සිට 29ක් දක්වා එකතුව රු. 332,013ක් ද, 2017 වර්ෂයේ ලබා දුන් ප්‍රතිලාභීන් 5 දෙනෙක් අයවිය යුතු වාරික 2 සිට 19 දක්වා එකතුව රු.120,297ක් ද 2019 දෙසැම්බර් 31 දිනට අය නොවී හිඟව පැවතුණි. 2016 වර්ෂයේ ණය ලබා ගෙවීම් පැහැර හැර ඇති ප්‍රතිලාභීන් තිදෙනෙකුම අදාල ස්වයං රැකියාවල නිරත නොවූ බව 2018 අගෝස්තු 31 දින ක්ෂේත්‍ර පරීක්ෂණයකට අනුව දන්වා තිබුණි. ඒ සම්බන්ධව 2020 පෙබරවාරි 07 දක්වාම අමාත්‍යාංශය ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි. | ණය ලබාදුන් පුද්ගලයන් පිළිබද පසු විපරම් කර ණය අයකිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම | 2019/12/31 දිනැති ලංකා බැංකු ප්‍රකාශයට අනුව හිග වාරික 2කට වැඩි ප්‍රමාණයක් නොගෙවා ඇති ප්‍රතිලාභීන් වැවිලි ප්‍රජා සන්නිවේදන නිලධාරීන් මගින් පසුවිපරම් කිරීමට දන්වා ඇති නමුත් කොරෝනා වසංගත තත්වය හමුවේ පසුවිපරම් කිරීම ගැටළුකාරී තත්වයක් ඇතිවූ බව දන්වමි. |

### 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017,2018 හා 2019 වර්ෂයන්හි දී ආරම්භ කරන ලද හා එදින සිට මාස 6ක් තුළ නිම කළ යුතු නිවාස ව්‍යාපෘති අවස්ථා පිළිවෙලින් 58,21 හා 18ක් අදාළ කාලපරිච්ඡේදය තුල නිමකර නොතිබූ අතර එහි ඇස්තමේන්තුගත පිරිවැය රු.2,128,171,041කින් රු.1,399,647,490ක් 2019 දෙසැම්බර් 31 දින වන විට වියදම් කර සියයට 66ක මූල්‍ය ප්‍රගතියක් පමණක් අත්පත් කර ගෙන තිබුණි. එම ව්‍යාපෘති 97 | නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති ඉටු කිරීමට හැකිවන පරිදි සැලැසුම් විධිමත් පරිදි පිළියෙල කිරීමට අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම හඳුන්වා දීමටත් මුදල් | පිළිතුරු ලබා දී නොමැත. |

| | | | |
|---|---|---|---|
| | තුළ ඇතුලත් නිවාස ඉදිකිරීම් 2117ක භෞතික ප්‍රගතිය (ප්‍රගති වාර්තාව අනුව) පරික්ෂාවේ දී ඉන් නිවාස 846ක් පමණක් නිමකර තිබුණි. ඒ අනුව ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදය වර්ෂ 2 ඉක්මවා ඇති බව නිරීක්ෂණය විය. | කාර්යක්ෂමව හා ඵලදායීව යෙදවීමට සැලසුම් සකස් කළ යුතු වීම. | |
| (ආ) | නාය යෑමෙන් අවතැන් වූ පුද්ගලයන් වෙනුවෙන් අයිලා වත්ත කොටසේ නිවාස 47ක් ඉදිකිරීම සඳහා 2018 වර්ෂයේ රු.47,000,000ක් අනුමත වී තිබුණි. එම නිවාස ඉදිකිරීම සඳහා 2018 පෙබරවාරි 12 දින වැවිලි මානව සංවර්ධන භාරය විසින් අයිලා වත්ත වතු සේවක සමුපකාර සමිතිය සමඟ එක් නිවසකට රු.950,000 බැගින් වූ ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම ප්‍රකාරව එම නිවාස ව්‍යාපෘතිය 2018 සැප්තැම්බර් 12 දින වන විට නිම කළ යුතු වුවත්**,** විගණන දිනය වූ 2019 දෙසැම්බර් 31 දින වන විටත් සිදු කර තිබෙන්නේ නිවාස ඉදිකිරීමේ පලමු අධියර දක්වා පමණි. | මහජනයා වෙත සේවා ඉටු කිරිමේදී ප්‍රමුඛතාවය ලබාදිය යුතු කාර්යයන්ට මූලිකත්වය දී නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති ඉටු කිරීමට හැකිවන පරිදි සැලැසුම් විධිමත් පරිදි සකස් කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |

## 3.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්‍ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 30 දින භෞතික පරීක්ෂණයේදී හැටන් ප්‍රදේශයේ රු.140,359,085ක් වටිනා නිවාස 153ක් හා නුවරඑළියප්‍රදේශයේ රු.108,750,000ක් වටිනා නිවාස 128 ක් නිවාස භාරදීමෙන් පසු හැටන් ප්‍රදේශයේ මාස 15ත් මාස 1 ත් අතර කාලයක් හා නුවරඑළිය ප්‍රදේශයේ අවුරුදු 03 ත් මාස 3 ත් අතර කාලයක් ඉකුත්වී තිබියදීත් ප්‍රතිලාභීන් පදිංචියට පැමිණ නොතිබුණි. ඒ අනුව නිවාස ලබාදුන් පසු අමාත්‍යාංශ නිලධාරින් මඟින් මෙම ව්‍යාපෘති අධික්ෂණය නොකිරීම මත දරනු ලැබූ වියදමට අදාල ප්‍රතිලාභ මහජනතාව වෙත ලැබී නොමැති බව හා රජයේ මුදල් අපතයක් වී තිබුණි**.** | රජයේ මුදල් අපතයක් නොවීමටත් මහජනයාට සාධාරණයක් වන පරිදිත් වැය කල යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ආ) | අභ්‍යන්තර විගණන අංශයේ පරීක්ෂාවට අනුව නිවාස ව්‍යාපෘති 35ක නිවාස ඒකක 612ක ඉදිකිරීම් නිමකර වසර දෙකක කාලයක් ඉක්මවා ගොස් තිබුණද එම නිවාස ප්‍රතිලාභීන් වෙත භාර දී නොතිබුණි. | නිවාස ප්‍රමිතියට අනුව ඉදිකර ප්‍රතිලාභීන් වෙත භාරදීම සිදු කළ යුතු වීම | පිළිතුරු ලබා දී නොමැත. |

## 3.4 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඇස්තමේන්තුගත පිරිවැය රු.192,635,000ක් වන හැටන් දිස්ත්‍රික්කයෙහි ව්‍යාපාති 10ක ඉඩම් තෝරා ගැනීමේදී ඇතිවී ඇති ආරවුල් හේතුවෙන් එම ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දමා ඇති බව නිරික්ෂණය විය. | ව්‍යාපෘති ආරම්භ කිරීමට ප්‍රථම ශක්‍යතා අධ්‍යනයක් කර, ඉදිකිරීම් කිරීමට සුදුසු ඉඩම් හඳුනා ගැනීමට අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම හඳුන්වා දිය යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |

## 3.5 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අභ්‍යන්තර විගණන අංශයේ පරීක්ෂාවට අනුව 2017 වර්ෂය තුලදී නිම කළයුතු රු.14,181,329ක් වටිනා නිවාස නොවන වෙනත් සංවර්ධන ව්‍යාපෘති 25ක් හා 2018 වර්ෂය තුළදී නිම කළ යුතු රු.12,262,097ක් වන ව්‍යාපෘති 3ක් ද වැඩ නිම කළ යුතු කාලය වසර 2ක් ඉක්මවූ ව්‍යාපෘති 8 කට අදාලවගෙවූ අත්තිකාරම් මුදල වන රු.911,664ක් මේ දක්වා අය කරගෙන නොමැති අතර රු.190,349ක් අත්තිකාරම් ගෙවූ ව්‍යාපෘතියක් වසර 2 කට පසු පළවන අධියර යටතේ පළමු හිමිකම් ඉල්ලුම් කර තිබුණි. වෙනත් සංවර්ධන ව්‍යාපෘති 15ක් නිමකල යුතු දින ඉක්මවා වසරක් ගත වීමෙන් පසු නිම කර තිබූ අතර ව්‍යාපෘති 4ක් සඳහා ගෙවූ අත්තිකාරම්මුදලවන රු.740,358ක් මාස 4කට පසු නැවත පියවා තිබුණි. ඒ අනුව රාජ්‍ය මුදල් සඵලදායී ලෙස උපයෝජනය කර නොමැති බව නිරීක්ෂණය විය. | නිසි අධීක්ෂණයකින් යුතුව අත්තිකාරම් ගෙවීම් කල යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |

## 3.6 වාර්ෂික කාර්යසාධන වාර්තාව

වාර්ෂික කාර්යසාධන වාර්තාවේ ඇතුළත් නිරවද්‍ය නොවූ තොරතුරු හා ඒ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති සඳහා වූ කාර්යය සාධන /ප්‍රගති වාර්තාවෙහි ව්‍යාපෘති ආරම්භක හා අවසාන දිනයන් දක්වා නොමැති වීමෙන් නිවසක් ඉදිකිරීම සඳහා වූ මාස 8ක සැලසුම් කළ කාලය ඉක්මවූ ව්‍යාපෘති ප්‍රමාදය හදුනාගැනීමට නොහැකි වීම හා ප්‍රමාදයන් සම්බන්ධයෙන් නීති රීති වලට අනුව කටයුතු නොකිරීම පිළිබඳ තොරතුරු සොයාගැනීමට නොහැකි වී තිබුණි. | නිවැරදි තොරතුරු අනුව වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කිරීමට අංශ අතර තොරතුරු කාලීනව හුවමාරු කර ගැනීමටත් අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම සකස් කළ යුතු විය. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ආ) | 2019 වර්ෂයේ ප්‍රගති වාර්තාව අනුව 2019 ආරම්භයේදී අවිච්ඡේද නිවාස 4920න් 2019 දෙසැම්බර් 31 දින වන විට නිමකර ඇති නිවාස සංඛ්‍යාව 2059ක් විය.ඉදිකිරීම් මාස 8ක් තුළ නිම කළ යුතු වුවත් 2019 දෙසැම්බර් 31 දිනට අවුරුද්දක් ඉක්මවූ නිම නොකල නිවාස 2861ක් විය.<br>නමුත් එම වාර්තාව වැඩි දුර පරීක්ෂාවේදී හරිත රන් නිවාස යටතේ 2018 රත්නපුර අදියර 1 යටතේ පෙන්ඩ්රික් වතුයායේ යෝජිත නිවාස සංඛ්‍යාව 15ක් ලෙස දක්වා තිබුණද සත්‍ය ලෙස 30ක් විය යුතු බවත් 2016 වර්ෂයේ ආරම්භකල 2019 වර්ෂයට ඉදිරියට ගෙනා නිම නොකල නිවාස සංඛ්‍යාව වාර්තාවට අනුව 760ක් ලෙස දක්වා තිබු නමුත් සත්‍ය අගය 1104ක් විය යුතු බවත් නිරීක්ෂණය විය. ඒ අනුව ඉදිකර නිමකර ඇති නිවාස සම්බන්ධ තොරතුරු නිසි පරිදි ලේඛන ගතවී නොමැති බව නිරීක්ෂණය විය. | නිවැරදි තොරතුරු අනුව වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කිරීමට අංශ අතර තොරතුරු කාලීනව හුවමාරු කර ගැනීමටත් අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම සකස් කළ යුතු විය. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ඇ) | විගණනයට ඉදිරිපත් කළ ප්‍රගති වාර්තාවන්හි ආකෘතිය විෂය භාර එක් එක් නිලධාරියා අනුව වෙනස් වූ අතර ඒකීය නොවන ආකෘති යටතේ ලබා දීම මත තොරතුරු සාරාංශ කිරීම නිසා විගණනයට බාධා ඇතිවිය. | නිවැරදි තොරතුරු අනුව වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කිරීමට අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම සකස් කළ යුතු විම. | පිළිතුරු ලබා දී නොමැත. |

## 3.7 විදේශ ආධාර ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඉන්දියානු රජයේ ආධාර ඇතිව පලමු යෝජිත නිවාස ඒකක 4,000 ව්‍යාපෘතියේ මූලික කටයුතු අධීක්ෂණය වෙනුවෙන් මුළු වටිනාකමින් සියයට 1.5ක් ව්‍යාපෘතියේ ප්‍රගතිය අනුව රජයේ ප්‍රතිපාදන වලින් වැවිලි මානව සංවර්ධන භාරය වෙත ගෙවීම් කිරිමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන තිබුණි. 2019/12/31 දින වන විට නිවාස 699ක් ප්‍රතිලාභීන් වෙත භාරc තිබූ බවත්නිවාස 1,368ක් සඳහා යටිතල පහසුකම් සපයා නොතිබුණ බවත්, නිවාස 265ක භූමිය තෝරා ගෙන හෝ සකස්කර නොමැති බවත් අභ්‍යන්තර විගණනයේදී නිරීක්ෂණය කර තිබුණි. ඒ අනුව වැවිලි මානව සංවර්ධන භාරය වෙත ගෙවීම් කල හැක්කේ රු.32,263,200කි. නමුත් නිසි අධීක්ෂණයෙන් තොරව රු. 34,997,000ක් ගෙවීම හේතුවෙන් රු.2,733,800ක වැඩිපුර ගෙවීමක් 2019 දෙසැම්බර් 31 දිනට නිරීක්ෂණය විය. | යම් මුදල් ගෙවීමකට නිර්දේශය අනුමැතිය ලබා දෙන හා ගෙවීම් සිදුකරන නිලධාරියා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු අතර රජයට අලාභයක් වන ලෙස කල ගෙවීම් සම්බන්ධව නීති රීති වලට අනුව කටයුතු කල යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ආ) | 2019 අගෝස්තු 20 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව ඉන්දියානු ආධාර යටතේ නිවාස ඒකක 5,000ක් ඉදිකිරීමට අදාලවද ඉහත පරිදි ව්‍යාපෘතියේ ප්‍රගතිය අනුව රජයේ ප්‍රතිපාදන වලින් වැවිලි මානව සංවර්ධන භාරය වෙත ගෙවීම් කිරිමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන තිබුණි. නමුත් නිවාස සංඛ්‍යාව පිලිබඳව එකගතාවය, ඉඩම් වෙන්කර සැලසුම් සකසා ගැනීම ආදී මූලික කටයුතු හෝ සිදු නොකර තිබියදී 2019 නොවැම්බර් 08 දින රුපියල් මිලියන 10ක අනාර්ථික ගෙවීමක් වැවිලි මානව සංවර්ධන භාරය වෙත සිදුකර තිබුණි. | - එම - | පිළිතුරු ලබා දී නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඉංදියානු රජය සමග එළඹී අවබෝධතා ගිවිසුම අනුව නිවාස 10,000ක් ඉදිකිරීමට ඉංදියානු රජය සමග අවබෝධතා ගිවිසුමකට එළඹෙන ලෙස අංක 10/0296/739/002 හා 2018 පෙබරවාරි 28 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. ඒ යටතේ නිවාස ඉදිකරමින් සිටින නමුත් අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමක් 2020 ජූලි 09 දින වන විටත් අමාත්‍යාංශය සතු නොවිය. | - එම - | පිළිතුරු ලබා දී නොමැත |
| (ඈ) | 2016 ජනවාරි 18 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට ලබාදී ඇති අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව ඉංදියානු නිවාස ඉදිකිරීම් ආරම්භ කිරීමට අවශ්‍ය මූලික කටයුතු සඳහා කලාපීය වැවිලි සමාගම් මගින් නිවසක් සඳහා රු.30,000 බැගින් දැරිය යුතු ලෙසත් නිවාස ඉදිකිරීමෙන් පසු නිවාස සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීමට පමණක් අමාත්‍යාංශය මගින් වැය කල යුතු වුවද, වතු ඉඩම් වල මූලික මැනුම් කටයුතු සඳහා පරීක්ෂා කල නියැදියට අනුව වතු 3ක් සඳහා රු. 355,835ක් අමාත්‍ය මණ්ඩල සංදේශයට පටහැනිව අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණි. | - එම - | පිළිතුරු ලබා දී නොමැත. |

**3.8 ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වැවිලි මානව සංවර්ධන භාරය 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ස්ථාපිත කර ඇති ඇපයෙන් සීමිත සමාගමකි. ඒ අනුව කිසිදු ක්‍රමවේදයකින් හා ගිවිසුමකින් තොරව සමාගමක් වෙත අමාත්‍යාංශයේ ඉදිකිරීම් ව්‍යාපෘති පැවරීම හා මුදල් නිදහස් කිරීම හා අමාත්‍යාංශ වෙනුවෙන් ගිවිසුම් වලට එළඹීම, නීතිරීති වලට පටහැනිවුවද මෙම ක්‍රියාවලිය දිගින් දිගටම සිදුකරමින් පවතින බව නිරීක්ෂණය විය. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් විධිවිධානද සැලැකිල්ලට ගෙන අදාළ ප්‍රසම්පාදනයන් සිදු කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශනයේ හා ප්‍රසම්පාදන මහපෙන්වීමේ 3.9.4 ඡේදය ප්‍රකාරව සමූපකාර සමිති වෙත එකතුව රු.මිලියන 2 කට වඩා වැඩි කොන්ත්‍රාත් නොදිය යුතු අතර නිශ්චිත කාලයක් තුල සමිතියක් විසින් ඉටුකරනු ලබන මුළු කොන්ත්‍රාත් සංඛ්‍යාව තුනකට නොවැඩි විය යුතු බව දන්වා තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් විධිවිධානද සැලැකිල්ලට ගෙන අදාළ සැලැසුම් | පිළිතුරු ලබා දී නොමැත. |

| | | | |
|---|---|---|---|
| | එසේ වුවද වැවිලි මානව සංවර්ධන භාරය මඟින් ඉටුකරනු ලබන සියලුම කොන්ත්‍රාත් ඉදිකිරීම් සඳහා අමාත්‍යාංශය වෙනුවෙන් වතු සේවක නිවාස සමූපකාර සමිති සමඟ ගිවිසුම්ගතවී ඉදිකිරීම් කරනු ලැබීමෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ දක්වා ඇති සීමාවන් ඉක්මවා කටයුතු කරතිබුණි. | පිළියෙල කළ යුතු වීම. | |
| (ඇ) | අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන ලබාදීමෙන් පසු එම ප්‍රතිපාදන අනුව සකස් කරන ලද ප්‍රමාණ පත්‍රයකට (BOQ) අනුව ඉදිකිරීම් සිදු කරනු ලබන වතු සමාගමට අයත් වතු සමූපකාර සමිති සමඟ ඇස්තමේන්තු වටිනාකමට කර්මාන්ත නිම කිරීමට වැවිලි මානව සංවර්ධන භාරය ගිවිසුමකට එළඹේ. උක්ත සියලු කොන්ත්‍රාත්තු වතු සමූපකාර සමිති විසින් උප කොන්ත්‍රාත් ලබාදී තිබේ. මෙසේ උප කොන්ත්‍රාත් ලබාදුන් ආයතනවල කර්මාන්ත නිම කිරීමේ හැකියාව පිළිබඳව වැවිලි මානව සංවර්ධන භාරය විසින් පරීක්ෂා කිරීමක් සිදු කර නොමැති අතර, ICTAD ආයතනයේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් වෙත ලබාදිය යුතු කොන්ත්‍රාත් ප්‍රමාණවත් හැකියාවක් නොමැති කොන්ත්‍රාත්කරුවන් විසින් හා කොන්ත්‍රාත්කරුවකු ලෙස ලියාපදිංචියක් හෝ නොමැති පුද්ගලයන් විසින් ඉටු කරනු ලබන බව ක්ෂේත්‍ර පරීක්ෂණවලදී අනාවරණය විය. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් විධිවිධානද සැලැකිල්ලට ගෙන අදාළ ප්‍රසම්පාදනයන් සිදු කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ඇ) | නිවාස ව්‍යාපෘති සඳහා පමණක් වසරකට රු.මිලියන දහසකට අධික ව්‍යාපෘති ප්‍රසම්පාදන ක්‍රමවේදයෙන් බැහැරව එනම් ලංසු ආරාධනා විධිමත් පරිදි යොමු නොකිරීම, ලංසු සුරක්ෂණ හා කාර්ය සාධන සුරක්ෂණ ලබා නොගෙන කොන්ත්‍රාත්කරුවන්ට ලබාදීම දිගින් දිගටම සිදුකරන බව නිරීක්ෂණය විය. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් විධිවිධානද සැලැකිල්ලට ගෙන අදාළ ප්‍රසම්පාදනයන් සිදු කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ඉ) | උප කොන්ත්‍රාත්කරුවන් විසින් මානව සංවර්ධන භාරයේ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සිදුකල ඉදිකිරීම් සඳහා ඉදිරිපත් කරන බිල් පත් සඳහා අමාත්‍යාංශය විසින් ගෙවීමේදී චෙක්පත් එම කොන්ත්‍රාත්කරුවන්ට ලිවීම වෙනුවට මානව සංවර්ධන භාරය නමින් ලිවීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන් හට මුදල් ලැබීමට බොහෝ ප්‍රමාදවී තිබුණි. 2018 ජූනි 01 දින සිට 2019 මැයි 30 දින දක්වා කාලය තුල හැටන් හා නුවරඑළිය දිස්ත්‍රික්කවල නියැදි පරීක්ෂාවට අනුව අමාත්‍යාංශය කොන්ත්‍රාත්කරුවන් වෙනුවෙන් නිදහස් කල | කොන්ත්‍රාත් කරුවන් සමග ගිවිසුම්ගතවී ඔවුන් වෙත ඍජුවම චෙක්පත් යොමු කිරීමෙන් රජයේ මුදල් අවභාවිතා වීම වලකා ගත යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |

| | | | |
|---|---|---|---|
| | රු.මිලියන 204.62කින් කොන්ත්‍රාත්කරුවන්ට නිදහස් කර ඇත්තේ රු.මිලියන 105.03ක් පමණි. ඒ අනුව කොන්ත්‍රාත්කරුගේ ශක්‍යතාව දුර්වල වීම හේතුවෙන් ඉදිකිරීම් ප්‍රමාදවීම , නිසි ප්‍රමිතියකට සිදු නොවීම මෙන්ම නිදහස් කරනු ලබන රජයේ මුදල් අවභාවිතා වීමක් වන බවට ද නිරීක්ෂණය විය. | | |
| (ඊ) | වටවල වතු සමිතියට අයත් ස්ට්‍රැතඩන් වතුයායේ ඍෘට්විල් හා ස්ට්‍රැතඩන් අංශවල පෙරනිමි කොන්ත්‍රාත් ක්‍රමය යටතේ නිවාස 100 ක්මාස 6කින් නිම කිරීම ඉදිකිරීම සඳහා රු.100,000,000 කට 2016 දෙසැම්බර් 09 දින තම ව්‍යාපාරය ලියාපදිංචි කරන ලද පුද්ගලික සමාගමක් වෙත 2016 දෙසැම්බර් 19 වැනි දින එහි සමුපකාර සමිතිය කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. නමුත් කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේදී ප්‍රසම්පාදන ක්‍රමය අනුගමනය කල බවට විගණනයේදී කිසිදු සාක්ෂියක් නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් විධිවිධානද සැලැකිල්ලට ගෙන අදාළ ප්‍රසම්පාදනයන් සිදු කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |
| (උ) | ස්ට්‍රැතඩන් වතුයායේ නිවාස 100ක් පෙරනිමි කොන්ත්‍රාත් ක්‍රමය යටතේ ඉදිකිරීම සඳහා 2016 දෙසැම්බර් 19 වැනි දින මාස 6 කින් නිම කර දීමට යටත්ව ගිවිසුම් ගතව ගෙවීම් කිරිම සඳහා හා 2017 මාර්තු 1 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි "උපරිමයෙන් එක් නිවාසයක් සඳහා වෙන් කරන ලද මුදල රු.1,000,000ක්" ලෙස තීරණය වී තිබූ නමුත් ඊට පටහැනිව ඒම නිවසක ප්‍රතිපාදන වැවිලි මානව සංවර්ධන භාරයේ ඉල්ලීම හා ව්‍යාපෘති ඉංජිනේරුගේ සහතිකය මත අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය අනුව රු.1,030,000 දක්වා වැඩිකර ගෙවා තිබුණි. ඉහත නිවාස 100 න් 50 ක් 2019 ජනවාරි 07 දින නිමකර භාරදී ඇති අතර ඒ සඳහා 2019 දෙසැම්බර් 31 දින වන විට ඉංජිනේරු අනුමැතිය අනුව ගෙවා ඇති වටිනාකම රු.47,065,717ක් ද ඊට අදාල රඳවාගැනීම් මුදල රු.2,214,815ක් ද විය. නමුත් ප්‍රමාද ගාස්තු අයකිරීමක් සිදුකර නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කටයුතු කල යුතු වීම හා ප්‍රමාද ගාස්තු අයකල යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ඌ) | 2018 ජනවාරි 12 දිනැති පෙරනිමි නිවාස සම්බන්ධ වතු සමුපාකාර සමිතිය හා ග්ලෝබල් කොමියුනිටි ඩිවලොප්මන්ට් (පුද්) සමාගම සමග ඇති කරගෙන තිබූ ගිවිසුම අනුව නිවාස 100ම පෙර නිමි නිවාස ක්‍රමයට ඉදිකළ යුතු වුවද ඉදිකර තිබූ නිවාස 50ම ඉදිකර තිබුනේ ඒකාබද්ධ ආකෘතිය එනම් පෙරසවි හා සාමාන්‍ය ඉදිකිරීම් එකතුවක් ලෙසය. | ගිවිසුම් අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |

## 3.9 වත්කම් කළමනාකරණය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සෞම්‍ය මූර්ති තොන්ඩමන් අනුස්මරණ පදනම යටතේ ක්‍රියාත්මකව පැවති 2017 වර්ෂයේදී අමාත්‍යාංශයට පවරාගත් පූල් බැන්ක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, රම්බොඩ සංස්කෘතික මධ්‍යස්ථානය, නෝර්වුඩ් ක්‍රීඩා සංකීර්ණය, හා ප්‍රජා ශක්ති මධ්‍යස්ථානය යන ආයතන හතරේ චංචල හා නිශ්චල දේපළ භාණ්ඩ සමීක්ෂණය කර එම වත්කම් නිසියාකාරව අමාත්‍යාංශයට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, මුදල් රෙගුලාසි 755 (1) හා (2) ප්‍රකාරව වාර්තා සකස් කර ඉදිරිපත් කිරීමට 2019 සැප්තැම්බර් 27 දින දක්වාම කටයුතු කර නොතිබුණි. උක්ත කරුණු හේතුවෙන් 2017 ජූනි 28 දිනැති අංක 1/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් කොම්ට්‍රෝල් ජනරාල් කාර්යාලය වෙත මෙම ආයතන හතරට අයත් වත්කම් ඉදිරිපත් කර නොතිබුණි. | වත්කම් නිසියාකාරව භාරගැනිමටත්, මුදල් රෙගුලාසි ප්‍රකාරව වාර්තා සකස්කර ඉදිරිපත් කිරීමටත් අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම සකස් කර ක්‍රියාත්මක කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ආ) | අමාත්‍යාංශ ගොඩනැගිල්ලේහි බිම් මහලේ පිහිටි කිරිහල සහිත ගොඩනැගිල්ල අමාත්‍යාංශයේ සුභසාධක සංගමය විසින් ගිවිසුමකට එළඹ බාහිර පාර්ශවයකට බදු දී තිබූ අතර, කිරිහලේ විදුලි හා ජලය සඳහා වූ වියදම හා කුලිය අමාත්‍යාංශය වෙත අයකර ගෙන රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් වෙනත් ආයතනවලට පැවරීමේ දී අමාත්‍යාංශයේ අරමුණු ඉටු කිරීමට බාධාවක් නොවන වත්කම් පමණක් විධිමත්ව පවරාදීමට කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත |
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනට පැවති භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව, හා මුදල් රෙගුලාසි 757 (2) (අ) හා (ආ) අනුව ඒවායේ අතිරික්ත හා ඌනතා සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ නිර්දේශ ටී සහ ඒ අකෘතියේ සටහන් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. භාණ්ඩ වර්ග 111ක් යටතේ අයිතම 396 ක ඌණතාවයක් හා අයිතම 106ක අතිරික්තයක් ඉහත සමීක්ෂණ වාර්තා අනුව නිරීක්ෂණය වූ නමුත් එම නැතිවූ භාණ්ඩ සම්බන්ධයෙන් හානි හා පාඩු ලේඛණයට ඇතුලත් කර මුදල් රෙගුලාසි 103(1) අනුව කටයුතු කිරීමට හා 2019 මුල්‍ය ප්‍රකාශයේ සටහන් අංක (11) යටතේ ඇතුලත් කිරීමටද කටයුතු කර නොතිබුණි. | එය මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වීම. | පිළිතුරු ලබාදී නොමැත. |

**3.10 පාඩු හා හානි**

-------------------

පහත සඳහන් නිරීක්‍ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------------------------------- | ------------------- | -------------------------------- |
| (අ) | කොටියාගල වතු යායේ යෝජිත නිවාස 184 කින් 42ක් පමණක් නිම කර ඇති අතර කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ 2016 මැයි 23 දිනෙන්ද පසුව එනම් 2016 ජූනි 08 ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නායයෑම් පර්යේෂණ හා අවදානම් කළමණාකරන අංශය මඟින් අදාල වාර්තාව ලබාගැනීමෙන් එම නිර්දේශයන් පිළිබඳව සැලකිලිමත්ව කටයුතු නොකිරීම හේතුවෙන් සිදුවී ඇති අඩුපාඩු දක්වා එම නිවාස, 42ක නිවාස ලාභීන් භාර ගෙන නොතිබුණි. නමුත් ඒ සඳහා අනුමත ඇස්තමේන්තුව වන රු.26,830,910, ඉක්මවා 2018 දෙසැම්බර් 31 දින වන විට කොන්ත්‍රාත්කරුට රු.40,443,527ක් ගෙවා තිබීම හේතුවෙන් එදිනට රු.13,612,617ක් වැඩිපුර ගෙවා තිබුණි. | අත්තිකාරම් ගෙවීමේදී නිසි අධීක්ෂණයෙන් පසුව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් විධිවිධාන අනුව මුදල් නිදහස් කල යුතු වීම හා අලාභය අයකර ගැනීමට කටයුතු කල යුතු වීම. | මෙම ස්ථානයේ නිවාස 184ක් සැලසුම් කළ නමුත් ස්ථානයේ ඇති පාරිසරික ගැටලුකාරී තත්ත්වය නිසා නිවාස 42ක් පමණක් නිම කිරීමට සිදු විය.<br>අධික වියදම් හේතුවෙන් ඔහු වැඩ බිම අතහැර යන ලදී. මේ පිළිබඳ අවස්ථා ගණනාවකදී දැනුම් දුන් අතර ඔහුට විරුද්ධව කටයුතු කිරීමට ඉක්ටාඩ් ආයතනය දැනුවත් කර පියවර ගැනීමට කටයුතු කෙරිණි. මෙම ආයතනය කළ අතිරේක වැඩ සඳහා බිල්පත් ඉදිරිපත් කර නොමැත. එම නිසා මෙහි දක්වා ඇති මුදල් වැඩිපුර ගෙවූ මුදලක් ලෙස සටහන්ව ඇත. |
| (ආ) | ඉහත දැක්වෙන නිවාස 42 ප්‍රතිලාභීන් විසින් පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කිරීමට 2018 සැප්තැම්බර් 10 දින වෙනත් ආයතනයක් වන බැරුන්ඩිනා ආයතනය සමග 2018 නොවැම්බර් 15 දිනට ප්‍රථම වැඩ නිම කිරීමට විනිවිධභාවයෙන් හා ප්‍රසම්පාදන ක්‍රියාමාර්ගයෙන් තොරව රු.මිලියන 7ක ගිවිසුමකට එකඟ වී 2019 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 6.84ක් ගෙවා තිබුණි. අනුමත ප්‍රතිපාදන ඉක්මවා සිදුවන මෙම වැය කිරීම් ද ඉහත මුදලට අමතරව රජයට අලාභයක් වී ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් විධිවිධාන අනුව හා රජයට අලාභයක් නොවන අයුරින් කොන්ත්‍රාත් ක්‍රියාත්මක කළ යුතු වීම. | අඩු පාඩු සකසන තෙක් නිවාස වල පදිංචියට යා නොහැකි බව නිවාස ලාභීන් දන්වා ඇත. වැඩ නවතා තිබූ බැවින් නිවාස වලට හානි කර ඇති බැවින් ඒ සඳහා ඇස්තමේන්තු සකසා ටෙන්ඩර් කිරීමට කාලයක් යන බැවින් අමාත්‍යාංශයේ වෙනත් ව්‍යාපෘති කරන බැරුන්ඩිනා ආයතනයටම පැවරීමටත් PHDT එකට ගෙවන සියයට 7 කළමණාකරන ගාස්තුවඔවුන්ට ගෙවීමටත් එකගවිය. |
| (ඇ) | පිටරත්මලේ ප්‍රවේශ මාර්ගය භෞතික පරික්ෂාවේ දී මතුපිට පස් කැපීම හා ඇතිරිම මාර්ගය මතුපිට පොලිතීන් ඇතිරිම ෂටරින් වෙනුවෙන් හා කොන්ක්‍රීට් යෙදීම සඳහා පිළිවෙලින් රු.20,037, රු.9,945, රු.9,945 හා රු.650,335ක් වන ලෙස එකතුව රු.690,262 වැඩිපුර ගෙවා ඇති බව නිරීක්ෂණය විය. | - එම - | PHDT පිළිතුර අනුව කොන්ත්‍රාත්කරු වරද පිළිගෙන නිවැරදි කළ බව දන්වා ඇත. ප්‍රමිතියට ඉදිකිරීම් නොමැතිවීම නිසා කළමනාකරන ගාස්තුවෙන් 4%ක් එනම් රු.27,251ක් අඩුකිරීමට නිර්දේශ කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අම්පිටිකන්ද නිවාස යෝජනා ක්‍රමයට අදාල පැතිබැම්ම ඉදිකිරිමට අදාලව පැතිබැම්ම පතුලට යොදා ඇති 1.3.6 කොන්ක්‍රිට් වෙනුවෙන් ඝන මීටර් 74.4ක් සඳහා රු.1,227,600ක් ගෙවා තිබුණි. නමුත් භෞතික පරික්ෂාවට අනුව ඉටුකර ඇති ප්‍රමාණයට ඝන මීටර 66.249 ක් වන බවත් ඒ අනුව රු.126,241ක් වැඩිපුර ගෙවා ගෙවා ඇති බවත් නිරීක්ෂණය විය. | - එම - | මෙයද අධීක්ෂණයේ දුර්වලතාවයක් නිසා සිදුව ඇති වරදක් නිසා ගෙවීමට නිර්දේශ මුළු මුදල රු.5,570,461 කළමනාකරන ගාස්තු වන 4% මුදලින් 50%ක් අඩුකිරීමට නිර්දේශ කරනු ලැබේ. ඒ අනුව අඩුකරන මුදල රු. 111,408ක් වේ. |
| (ඉ) | KB- 9614 රථයට 2017 පෙබරවාරි මාසයේ සිදුවූ අනතුරෙන් රජයට සිදුවූ රු.272,276කින් රු 89,759ක් තාවකාලික පදනමින් සිටි රියදුරුගෙන් අයකර ගත යුතු වුවද එම රියදුරා සේවයෙන් ඉවත් වීම නිසා මේ දක්වා අයකර ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි 113(4) ප්‍රකාරව අය කර ගැනීමට හෝ කපාහැරීමට කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ඊ) | 2016 අගෝස්තු මාසයේ වෙන් කළ වාහනයකට සිදුවූ අනතුරකදී තුන්වන පාර්ශවීය රක්‍ෂණයක් පමණක් සිදු කර තිබීම හේතුවෙන් එය අළුත්වැඩියා කිරීමට රු.1,032,130 ක් වැයකර තිබුණි. 2018 ඔක්තෝබර් 25 දින ඉදිරිපත් කරන ලද මුදල් රෙගුලාසි 104(4) වාර්තාවෙන් අනතුරට වගකිවයුතු නිලධාරින් දෙදෙනාගෙන් අළුත්වැඩියා වියදම අයකර ගැනීමට නිර්දේශය කර තිබුණත්, 2020 අගෝස්තු 30 දින වන විටත් කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉදිරිපත් කර ඇති නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු වීම. | මු.රෙ.104 (4) යටතේ පවත්වන ලද පරීක්ෂණයේ අවසන් වාර්තාවට ඇතුලත් වාහනයට වූ අලාභය අධ්‍යක්ෂ ජනරාල්ගෙන් සහ රියදුරුගෙන් අයකර ගැනීමට නියෝග කර ඇති අතර එම නිලධාරීන් දෙදෙනා සේවයෙන් ඉල්ලා අස්වී ඇත. ඒ අනුව පෞද්ගලික ලිපි ගොනු ආශ්‍රයෙන් ඔවුන්ගේ තොරතුරු ලබාගෙන අදාල මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කරමින් පවති. |

**3.11 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම**

---------------------------------------------------------

හිඟහිටි විගණන විමසුම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | විගණන විමසුම පිළිබඳ විස්තරය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දී අභ්‍යන්තර විගණන අංශයෙන් ඉදිරිපත් කර ඇති විමසුම් 31කින් විගණන විමසුම් 17ක් සඳහා පිළිතුරු ලැබීම මාස 01 සිට මාස 08 දක්වා ද විමසුම් 06ක් සඳහා පිළිතුරු ලැබීම සති 02 සිට සති 03 දක්වා ද කාලයක් ගෙන තිබුණි. ඉතිරි විමසුම් 08 සඳහා 2020 අගෝස්තු මස 30 දින වන විට මාස 9 සිට මාස 19 ත් අතර කාලයක් ගතවී තිබියදීත් පිළිතුරු ලබා දී නොතිබුණි. | විගණන විමසුම් සඳහා නියමිත කාලය තුල පිළිතුරු ඉදිරිපත් කර එම වැරදි නිවැරදි කිරීමටකටයුතු කල යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (ආ) | ජාතික විගණන කාර්යාලය මගින් 2019 වර්ෂයට අදාලව නිකුත් කල විගණන විමසුම් 13 අතරින් විගණන විමසුම් 4 ක් සඳහා පිළිතුරු ලැබීම සති 02 සිට මාස 4 දක්වා ද , විගණන විමසුම් 5 කට අමාත්‍යාංශයෙන් 2020 සැප්තැම්බර් 17 දින වන විට මාස 7ත් මාස 1 ½ ක කාලයක් ගතවී තිබියදීත් පිළිතුරු ලැබී නොතිබිණ. | .- එම - | පිළිතුරු ලබා දී නොමැත. |

## 3.12 කළමනාකරණ දූර්වලතා

----------------------------

පහත සඳහන් නිරීක්‍ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වතුකර ප්‍රජාව සඳහා ඉඩම් හිමිකාරිත්වය සහ උචිත නිවාස පහසුකම් ලබාදිම පිළිබදව 2016 දෙසැම්බර් 06 දිනැති කෙටුම්පත් අමාත්‍ය මණ්ඩල තීරණය මගින් හා 2017 ඔක්තෝබර් 27 දිනැති හා අංක අමප/17/2281/739/001-III දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව එදිනෙන් පසු මෙවැනි නිවාස කොන්ත්‍රාත් ඉදිකිරීම් සඳහා ඉඩම් තෝරා ගැනීමේදී වගාවන් නොමැති ඉඩම් තෝරා ගැනීමට යෝග්‍ය බව දන්වා ඇත. එසේ වුව ද 2019 නොවැම්බර් 25 සිට 29 දින දක්වා සිදුකලක්ෂේත්‍ර පරික්ෂාවේදී නියදියට අනුව හැටන්, නුවරඑළිය හා ,බදුල්ල ප්‍රදේශයේ තේ වගාකර තිබූ එළදායී ඉඩම් භූමිය වශයෙන් එකතුව ආසන්න වශයෙන් අක්කර 73.1ක් වගා කල තේ ගලවා ඉවත් කර තිබුණි. | අමාත්‍ය මණ්ඩල තිරණය අනුව කටයුතු කල යුතු වීම. | නිවාස ව්‍යාපෘති සඳහා ප්‍රයෝජනවත් තේ වතු භාවිතා කොට ඇති බවට විගණනයේ සඳහන් කොට ඇති කරුණ ඉතාමත් සත්‍යයකි<br>මෙම නව නිවාස ව්‍යාපෘති සැලසුම් කළේ දැනට ඉතා පැරණි පේළි නිවාස කඩා ඉවත් කර එම ප්‍රදේශයේ ආපදා කළමනාකරණ නොමැති නිවාස පද්ධතියක් සකස් කිරීමටය. නමුත් දැනට සිදුවනුයේ එම ලයින් කාමර එසේ තිබියදීම වෙනත් ස්ථානවල තේ ගලවා නිවාස ඉදිකිරීමයි. මෙය ඉන්දියානු නිවාස වැඩසටහනේ ද ප්‍රධාන ගැටලුව වී ඇති අතර බොහෝ පිරිස් නව නිවාස නාමිකව පවත්වාගෙන යමින් පැරණි නිවාසවල පදිංචිව සිටිති. එබැවින් විශාල මුදලක් වැයකොට සිදු කරන මෙම ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට නම් දූර්වල ලයින් කාමර කඩා එම ස්ථානවල පමණක් නිවාස ඉදිකිරීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2009 සිට 2014 වර්ෂය දක්වා නිකුත් කරන ලද වතු නිවාස ඉදිකිරීම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව පැවති පේලි නිවාස හෝ තාවකාලික මඩු වැනි දෑ නැවත භාරදීමේ එකඟතාවය මත නව නිවාස භාරදීම සිදු කළ යුතුය. 2019 නොවැම්බර් 25 දින සිට 30 දක්වා විගණනය විසින් නුවරඑළිය දිස්ත්‍රික්කය තුල සිදුකරන ලද ක්ෂේත්‍ර පරික්ෂාවේදි නිවාස ප්‍රතිලාභීන් වෙත ලබාදුන් වතු 17ක අංශ 22ක පැවති නිවාස 491කින් වතු 15ක අංශ 20 කට අදාලව පැරණි පේළි නිවාස ඉවත් කර නොතිබුණි. ඒ අනුව එම පැරණි නිවාස වලින් ඉවත්වීම සිදු නොවිම හේතුවෙන් එම ඉඩම් වෙනත් කටයුතු සඳහා භාවිතා කිරිමක් සිදු නොකර එම ප්‍රතිලාභීන්ගේ පවුල් විසින්ම තවදුරටත් භාවිතා කර තිබුණි. | -එම - | -එම - |
| (ඇ) | 2015 අප්‍රේල් 08 දිනැති අමාත්‍ය මණ්ඩල තිරණය දක්වා ඇති පරිදි ප්‍රතිලාභින් වෙත ණය හා එතෙක් භාවිතා කල ලයින් කාමර නැවත භාර දීමෙන් පසු හා නිවාස වල ණය සම්පූර්ණයෙන් අයකර ගැනීමෙන් පසු නිවාස සඳහා ඔප්පු ලබාදිය යුතු වුවත්, එලෙස කටයුතු කිරීමෙන් තොරව නුවරඑළිය ප්‍රදේශයේ 2016 සිට 2017 දක්වා ණය හා ආධාර පදනම මත ලබාදුන් නිවාස 240 ක් සම්බන්ධව 2019 නොවැම්බර් 25 සිට 29 දින දක්වා සිදුකලක්ෂේත්‍ර පරික්ෂාවේදී නිවාස 116ක ප්‍රතිලාභීන් වෙත ඉඩම් සඳහා ඔප්පු ලබාදීම් නිරික්ෂණ විය. | අමාත්‍ය මණ්ඩල තිරණය අනුව කටයුතු කල යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ඈ) | නව ජීවන වතු නිවාස වැඩසටහන පිළිබඳව 2009 වර්ෂයට අදාල මාර්ගෝපදේශයේ අංක 7.2 යටතේ ප්‍රතිලාභීන් තෝරාගැනීමේදී වැවිලි මානව සංවර්ධන භාරයේ හා වතු නිවාස සමුපකාර සමිතියේ සහභාගිත්වයෙන් යුතු කමිටුවක් මඟින් නිර්ණායක 07ක් මත පදනම්ව සිදුකල යුතු වුවත් ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී එවැනි කමිටුවක් පත් කර සිදුකල බවට හෝ ප්‍රතිලාභීන් තෝරා ගැනීම නිවැරදිව සිදුවන බව අමාත්‍යාංශය විසින් අධීක්ෂණය කර හෝ නොමැති අතර ඒ සම්බන්ධව වැඩිදුර පරික්ෂා කිරිමට ප්‍රතිලාභීන්ගේ ලැයිස්තු හැර වෙනත් ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය. | ප්‍රතිලාභීන් තෝරාගැනීමේදී විධිමත් ක්‍රම වේදයක් අනුගමනය කිරීම හා වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සැලසෙන පරිදි නිලධාරීන් යොදවා ඔවුන් නිසිපරිදි දැනුවත් කල යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ප්‍රතිලාභීන් සම්බන්ධයෙන් නිවාස ව්‍යාපෘති සඳහා වූ මාර්ගෝපදේශය අනුව නිවාස ප්‍රතිලාභින් තේරීමේදි වත්තේ ලියාපදිංචි සේවකයකු වීම අනිවාර්ය විය යුතුය යන්න දැක්වෙන අතර අමාත්‍ය මණ්ඩල තිරණ ප්‍රකාරව නිවාස ලබාදීමේ දී නායයාම් අවධානමට මුහුණ දුන් හා අවධානම් සහිත ප්‍රදේශ වල වතු සේවයේ නියුතු පවුල්වල අයට ආධාර ලෙස හා අනිකුත් වතු වල සේවය කරනු ලබන පවුල් සඳහා ණය හා ආධාර මිශ්‍ර පදනම මත ලබා දීමට තිරණය කර එය ක්‍රියාත්මක වන නමුත් 2019 නොවැම්බර් 25 සිට 29 දින දක්වා සිදුකරන ලද ක්ෂේත්‍ර පරික්ෂාවේදි එම නිර්නායක උල්ලංඝනය කරමින් නිවාස ලබාදී ඇති බව නිරීක්ෂණය විය. එනම් හැටන් හා නුවරඑළිය කළාපයේ පරීක්ෂා කල නිවාස 986කින් නිවාස 14ක් වත්තේ සේවය නොකරන අය වෙත ලබා දී තිබූ බව නිරීක්ෂණය විය. | - එම - | පිළිතුරු ලබා දී නොමැත. |
| (ඊ) | නිවාස ඉදිකිරීම සම්බන්ධ මාර්ගෝපදේශයට අනුකූලව නිවාස ඉදිකිරීම් ආරම්භ කිරිමට පෙර ප්‍රතිලාභින් හදුනාගෙන ලැයිස්තු සකස්කර නිවාස ඉදිකිරීම් ආරම්භ කළ යුතු වුවත් ස්ට්‍රැතඩන් වතු යායේ ස්ට්‍රැතඩන් කොටසේ පෙර නිමි ව්‍යාපෘතිය ඉදි කිරීම සම්බන්ධව 2016 දෙසැම්බර් 21 දින කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුමට එළඹී ඇති නමුත්, විගණිත දිනවන 2019 නොවැම්බර් 30 දින දක්වාම මෙම නිවාස 50 සඳහා ප්‍රතිලාභින් හදුනා ගෙන නොතිබුණි. | ව්‍යාපෘතිය ආරම්භයට පෙර ප්‍රතිලාභීන් නිවැරදිව හදුනා ගත යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |
| (උ) | අවශ්‍යතාවය මත පදනම්ව ප්‍රතිලාභින් තෝරා ගැනීමේ ක්‍රමවේදයේ පැවති ගැටළු හේතුවෙන් 2019 නොවැම්බර් 25 සිට 29 දින දක්වා සිදුකරන ලද ක්ෂේත්‍ර පරික්ෂාවේදි නුවරඑළිය ප්‍රදේශයේ විගණන නියදිය අනුව රු. 2,300,000ක් වටිනා නිවාස 03ක් ලබාදුන් ප්‍රතිලභින් විසින් ඒවා භුක්ති විදිමෙන් තොරව වෙනත් පාර්ශවයන්ට කුලියට ලබා දී තිබූ බවත් ඒ අනුව තොරගත් ප්‍රතිලාභින් සඳහා මෙම නිවාස අත්‍යාවශ්‍ය නොවන බවත් නිරික්ෂණය විය. | -එම - | පිළිතුරු ලබා දී නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ඍ) | නිවාස ව්‍යාපෘතිය ආරම්භයේ සිටම නිවාස ඉදිකිරීම් වැවිලි මානව සංවර්ධන භාරය මගින් ක්‍රියාත්මකකර අධීක්ෂණය කරනු ලබන අතරහරිත රන් නිවාස ව්‍යාපෘති සඳහා 6%ක් කළමණාකරණ ගාස්තු ගෙවනු ලබයි. ඒ අනුව 2018 වර්ෂය තුල රු.45,781,306ක් ද 2019 වර්ෂය තුල රු. 53,650,870ක් ද ගෙවා තිබුණි. නමුත් කළමණාකාර ගාස්තු ගෙවීම සඳහා ලබාගත් අනුමැතියක් නොතිබුණ අතර ව්‍යාපෘති අධීක්ෂණයට හෝ කළමණාකරණ ගාස්තු ගෙවීමට වැවිලි මානව සංවර්ධන භාරය හෝ වතු සමුපාකාර සමිති සමග ගිවිසුමක් ද නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් විධිවිධාන අනුව කොන්ත්‍රාත් ක්‍රියාත්මක කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |
| (එ) | 2017 පෙබරවාරි 21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රු.1,000,000ක් වන නිවසක වටිනාකමින් රු.480,000ක් ප්‍රදාන ලෙසත් රු.520,000ක් ණය ලෙසත් ලබාදීමට අනුමතවී තිබුණි. නමුත් ඒ සඳහා අමාත්‍යාංශය උපදෙස් ලෙස ඉදිරිපත් කර ඇති මග පෙන්වීම් අත්පොත අනුව සියයට 4 පොලී අනුපාතයක් යටතේ රු. 494,000ක් ණය ලෙස හා රු.506,000ක් ආධාර ලෙස අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව උපදෙස් ලබාදී තිබුණි. තවද ණය නැවත ගෙවීම ආරම්භකල යුත්තේ කුමන දිනක සිටද යන්න ද එහි සඳහන් වී නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණ අනුව නිවැරදි උපදෙස් ලබාදිය යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ඒ) | නුවරඑළිය කලාපයේ ඉදිකල නිවාස 235ක නියැදි පරීක්ෂාවට අනුව දැරූ පිරිවැයෙන් කොටසක් ණය පදනම මත ලබාදුන් බවට ප්‍රතිලාභීන් විසින් අත්සන් කර ඇති පත්‍රිකාවක් ඇති නමුත් වලංගු ගිවිසුමක් අත්සන් කර නොමැති බැවින් ගිවිසුම් ගත වූ දිනය, ණය කොන්දේසි ආදිය ඇතුලත් වී නොතිබුණි. පත්‍රිකාවේ 5.03 ඡේදය යටතේ ණය අයකර ගැනීම ඉදිරියේදී ගනු ලබන තීරණයට යටත් ලෙස දක්වා ඇති නමුත් ණය අයකර ගැනීමට අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අවශ්‍ය කිසිඳු පියවරක් ගෙන නොතිබුණි. | ණය අය කරගැනීමට කටයුතු කල යුතු වීම | පිළිතුරු ලබා දී නොමැත. |
| (ඔ) | මාසික වාරිකය රු.3,800ක් බැගින් වාරික 180 කින් ණය මුදල නැවත අයකිරීමට දක්වා තිබුණද අදාල මගපෙන්වීම් අනුව ණය අයකිරීමේ ක්‍රමවේදය හා එහි වගකිවයුතු නිලධාරීන් පිළිබඳ ක්‍රමයක් දක්වා නොතිබුනු අතර අදාල ණය ලාභියා හා අමාත්‍යාංශය අතර ගිවිසුමක්ද | හිඟ ණය ශේෂ හඳුනා ගැනීමට සුදුසුවන වන අයුරින් පොත් පත් නඩත්තු කල යුතු වීම. | පිළිතුරු ලබාදී නොමැත |

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | නොමැති බැවින් එම ණය නැවත අය කිරීම ගැටළු සහගත විය. තවදමෙතෙක් ණය ලාභීන්ගෙන් කොපමණ ණය අය කලේද, කොපමණ ණය අයවිය යුතුද යන්න හදුනාගත හැකි පරිදි තොරතුරු නඩත්තු කිරීම හා ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ඕ) | අමාත්‍යාංශය මගින් ඉදිරිපත් කර ඇති මහ පෙන්වීම අනුව නිවාස ඉදිකිරීම සඳහා ලබා දෙන ණය මුදල් සඳහා සියයට හතරක පොළියක් අයකරන බව දක්වා ඇති නමුත් එම ආදායම අයකර ගැනීම සම්බන්ධ තොරතුරු හෝ වර්ෂය තුල ලැබූ ණය පොලී ආදායම හෝ ලැබිය යුතු ණය පොලී ආදායම හදුනාගත හැකි පරිදි පොත් පත් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව පොත් පත් පවත්වා ගැනීමට කටයුතු කල යුතු වීම. | පිළිතුරු ලබාදී නොමැත |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | තිරසර සංවර්ධන අභිමතාර්ථ වලට අනුව පේලි නිවාස වල ජීවත් වන වැවිලි ප්‍රජාව වෙත 2020 වසර අවසන් වන විට, පානීය ජල පහසුකම්, විදුලිය සහ පිවිසුම් මාර්ග සහිතව තම අයිතියට වෙන්වූ පර්චස් 07ක භූමියක් සමඟ නිවාස ඒකක 3234 ක් හිමිකර දීම ලෙස ක්‍රියාකාරි සැලැස්ම තුල දක්වා තිබුණි. 2019 දෙසැම්බර් 31 දින වන විට නිවාස ඒකක 2059ක් ඉදිකිරීම් සම්පූර්ණ කර ඇති නමුත්, ඉදිකළ නිවාසද නිසි ප්‍රමිතයට නොමැති වීම හේතුවෙන් හැටන් හා නුවරඑළිය ප්‍රෙද්ශයේ පරීක්ෂාකල නියැදියට අනුව පමණක් නිවාස 281ක් ප්‍රතිලාභීන් භාර ගැනීම හෝ පදිංචිවීමට කටයුතු කර නොතිබුණි. | 2020 වසර අවසන් වන විට තිරසර සංවර්ධන අභිමතාර්ථ වලට අනුව යෝජිත ඉලක්ක ළඟා කර ගැනීමට හැකි වන ලෙස කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලබාදී නොමැත |
| (ආ) | ඉඩමෙහි භූවිෂමතාවට අනුකුලව ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ ලබාදී තිබූ NBRO වර්තාවලට අනුව හා සැලසුමට අනුකුලව භූමියෙහි ප්‍රමාණය හා එහි තත්වය සලකා බලා උචිත පරිදි නිවාස සැලසුම් කිරීමට හෝ ආරක්ෂිත පියවර ගැනීමට කටයුතු නොකිරීමෙන් පදිංචි | මහජන ආරක්ෂාව පිළිබද ප්‍රමුඛතාවය ලබාදීමටත් මහජන මුදල් උපරිම ඵලදායිතාවයෙන් වැය කිරීමටත් | පිළිතුරු ලබා දී නොමැත. |

| | | |
|---|---|---|
| නිවැසියන්ට හානි වීමේ අවදානමක් හා ඒම නිවාස කෙටි කලකින් භාවිතා කිරීමට නොහැකි තත්වයට පත්වීම හේතුවෙන් ඉදි කිරීමට දැරූ පිරිවැයේ ඵලදායිතාවයට අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. | කටයුතු කල යුතු වීම. | |

5. **යහපාලනය**

--------------

5.1 **මහජනයා වෙත සේවා ඉටු කිරිම**

-------------------------------------

| | **විගණන නිරික්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | මහජන පැමිණිලි භාර ගැනීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර ඇතත් මහජනයාගෙන් පැමිණිලි ලබා ගැනීමේ ක්‍රමවේදයක් හා පැමිණිලි ලේඛන ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | මහජන පැමිණිලි ලබා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතුය. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ඇ) | රජයේ හා පෞද්ගලික වැවිලි සමාගම්වල සේවය කරන ඉඩම් අහිමි ජනතාව සඳහා නිවාස හා යටිතල පහසුකම් සංවර්ධනය කිරිමේ අරමුණින් නව ගම්මාන හා නගර නිර්මාණ කිරිම අමාත්‍යාංශයේ කාර්ය භාරයේ දක්වා තිබුණද වර්තමානයේ එසේ කිරිම වෙනුවට පවතින තේ වතු තුලම පවතින පේළි නිවාස පිහිටි ඉඩම් වලද ඊට අමතරව වත්තේම පවතින වෙනත් ඉඩම්වලින් නිවස හා යටිතල පහසුකම් ඉදිකිරීම තුලින් හැටන්, නුවරඑළිය යටතේ පමණක් වගා කල හැකිඉඩම් අක්කර 1,312 ක් අහිමි වීමට නියමිත බව 2019 දෙසැම්බර් වලට යෝජිත නිවාස ව්‍යාපෘති අනුව අනාවරණය විය. | යෝජිත ව්‍යාපෘතීන් යෝජිත හා රටට හිතකර අයුරින් ක්‍රියාත්මක කළ යුතු වීම. | නිවාස ව්‍යාපෘති සඳහා ප්‍රයෝජනවත් තේ වතු භාවිතා කොට ඇති බවට විගණනයේ සඳහන් කොට ඇති කරුණ ඉතාමත් සත්‍යයකි. තවද මෙම නව නිවාස ව්‍යාපෘති සැලසුම් කළේ දැනට ඉතා පැරණි පේළි නිවාස කඩා ඉවත් කර එම ප්‍රදේශයේ ආපදා කළමනාකරණ නොමැති නිවාස පද්ධතියක් සකස් කිරීමටය. නමුත් දැනට සිදුවනුයේ එම ලයින් කාමර එසේ තිබියදීම වෙනත් ස්ථානවල තේ ගලවා නිවාස ඉදිකිරීමයි. මෙය ඉන්දියානු නිවාස වැඩසටහනේ ද ප්‍රධාන ගැටලුව වී ඇත. |

## 6. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 21කින් 8ක්ම පුරප්පාඩුවී තිබුණි**.** | අමාත්‍යාංශයේ කාර්යසාධනයට තනතුරු පුරප්පාඩු විශේෂයෙන් බලපාන බැවින් ඒවා පිරවීමට වහාම කටයුතු කල යුතු වීම. | අදාල පුරප්පාඩු සම්පූර්ණ කරන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. |
| (ආ) | වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සපයන්නන්ට විවිධ ව්‍යාපෘති වල ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු කිරීමට රාජකාරී පවරා දී තිබුණද විගණනය විසින් 2019 නොවැම්බර් 25 සිට 29 දින දක්වා සිදු කරන ලද ක්ෂේත්‍ර පරික්ෂාවේදි ඔවුන් එම රාජකාරී වල යෙදුණු බවට කිසිදු සාක්ෂියක් නොවීය. ඒ අනුව අමාත්‍යාංශයේ වැටුප් ගෙවනු ලබන හා අමාත්‍යාංශයට පමණක් සීමාවූ තනතුරු ලෙස බඳවාගත් මෙම නිළධාරීන් ප්‍රාදේශිය ලේකම් කාර්යාල හා නගර සභා වලට අනුයුක්තව කටයුතු කර තිබු බව අනාවරණය විය. | අමාත්‍යාංශයේ අවශ්‍යතාවය මත බඳවාගත් නිලධාරීන් අමාත්‍යාංශයේ ව්‍යාපෘති කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා යොදවා ගත යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |